# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

ගණිතය - 1 ශ්‍රේණිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

නම - වී.ජී චන්ද්‍රලතා ගුරුතුමිය - ර /ශ්‍රී රාහුල ප්‍රාථමික විදුහල

2 පාඩම - ද්‍රව්‍ය හෝ ද්‍රව හෝ ප්‍රමාණ සැසඳීම

පෙරවැඩ කාර්ය පත්‍රිකාව

## පෙර සූදානම් කරගත යුතු දේවල්

ලොකු කුඩා එකම වර්ගයේ ද්‍රව්‍ය, ලොකු කුඩා ඝණ වස්තු, ලොකු කුඩා කොඩි, පදම් කළ මැටි, ලී කුඩු ,පිඟන් විවිධ තරමේ, එකම හැඩයේ විනිවිද පෙනෙන බෝතල්, යෝගට් කෝප්ප ,පුනීල ,වර්ණ කළ ජල බේසම් ,නෙට් වළලු.



1 ගුරුතුමිය දෙන සම්පත් දැමූ වර්ණ සහිත සම්පත් පෙට්ටි කණ්ඩායම් නායකයන් ගන්න .

2 එළිමහනේ ගසා ඇති අදාළ වර්ණ සහිත කොඩිය ළඟට සිසු කණ්ඩායම් යන්න.

3 සම්පත් දැමූ වර්ණ පෙට්ටිය පැදුර මතට දමන්න.

4 කැමති පරිදි නිදහසේ ද්‍රව්‍ය සමඟ නිරත වීමට ඉඩ හරින්න.

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

ගණිතය - 1 ශ්‍රේණිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

නම - වී.ජී චන්ද්‍රලතා ගුරුතුමිය - ර /ශ්‍රී රාහුල ප්‍රාථමික විදුහල

## 2 පාඩම - ද්‍රව්‍ය හෝ ද්‍රව හෝ ප්‍රමාණ සැසඳීම
පැවරුම 1

1 ගුරුතුමිය දෙන උපදෙස් අනුව සෑම දරුවෙකුටම එකම වර්ගයේ ද්‍රව්‍ය දෙකක් ලොකු කුඩා වශයෙන් තැබීමට කියන්න.

2 පදම් කළ මැටිවලින් ලොකු කුඩා කැවුම් සෑදීමට පවසන්න.

3 තාත්තාගේ බත් පිගානත් ඔබගේ බත් පිගානත් දී ඇති පොල් කුඩු පිගන්වල ට දමමින් පෙන්වන්න.

4 මේ කවිය ගුරුතුමිය සමග ගායනා කරමින් ක්‍රියාකාරකම කරන්න.

ලොකු ලොකු දේ ලොකු රවුමට.
පොඩි පොඩි දේ පොඩි රවුමට.
පුංචි අතින් දමමු අපි.
දෙයි අත්පුඩි ගුරුතුමී.



1 සිසු කණ්ඩායම් වලට පාට දැමූ වතුර බේසම් විනිවිද පෙනෙන බෝතල් පුනීල හා යෝගට් කෝප්ප ලබාදී එළිමහනට ගන්න.

2 එක සමාන බෝතල් වලට ලොකු කුඩා බෝතල් වලට ජලය දමමින් ප්‍රමාණ සැසඳීමට යොමු කරන්න.

3 සමාන බෝතල් පිරවීමට ගිය යෝගට් කෝප්ප ගණන එම බෝතල් ඉදිරියෙන් තබන්න.

4 අඩුවෙන් හා වැඩියෙන් ජල ප්‍රමාණ ඇල්ලු බෝතල් ඉදිරියෙන් ද යෝගට් කෝප්ප ගණන තබන්න.

<u>පුංචි දූවේ පුතේ මේ ක්‍රියාකාරකම් කර ගුරුතුමියගෙන් ලොකු තරුවක් ඉල්ලා ගන්න.</u>

1 පහත කොටුවේ ඇති ලොකු රූප රතු පාටිනුත් කුඩා රූප කහ පාටිනුත් පාට කරන්න.



2 මේ පෝච්චිවල ට සමාන මලත් ඉදිරියෙන් අඳින්න.



3 අඩුවෙන් ඇති ජල බඳුන් නිල් පාටිනුත් වැඩියෙන් ඇති ජල බඳුන් කොළ පාටිනුත් පාට කරන.



# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

ගණිතය - 1 ශ්‍රේණිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

නම - වී.ජී චන්ද්‍රලතා ගුරුතුමිය - ර /ශ්‍රී රාහුල ප්‍රාථමික විදුහල

## 2 පාඩම - ද්‍රව්‍ය හෝ ද්‍රව හෝ ප්‍රමාණ සැසඳීම
## පසුවැඩ කාර්ය පත්‍රිකාව

1 ඔබගේත් යහළුවාගේත් වතුර බෝතල් ළඟට ගන්න. වැඩියෙන් වතුර බී ඇත්තේ කවුද? අඩුවෙන් වතුර බී ඇත්තේ කවුද?

2 මුළු පන්තියේම සමානව වතුර බී ඇති යහළුවන් පවසන්න.

3 ඔබේ පන්ති කාමරයේ ඇති එකම වර්ගයේ ලොකු දේවල් හා පොඩි දේවල් පෙන්වන්න.

4 ඒවා අභ්‍යාස පොතේ ඇඳ පෙන්වන්න.

5 අවට පරිසරයේ ඇති කොළ ගොඩක් ඇති ගසක් හා කොළ ටිකක් ඇති ගසක් ඇඳ පෙන්වන්න.